www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊය උතුරේ දී සසප සාමාජිකයන් ඉලක්ක කර ඇත්තේ මන්ද?

**කේ. රත්නායක විසිනි**
**2003 ජූනි 19**

උතුරේ කයිට්ස් දූපතෙහි දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකයන්ට එරෙහිව දෙමල ඊළම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය විසින් සිදු කෙරුනු ප්‍රචන්ඩ ක්‍රියා හා තර්ජනය කිරීම් සම්බන්ධ නඩු තුන, පසු ගිය මාස නවය පුරා අසාමාන්‍ය ලෙස ප්‍රමාද වී තිබේ. දිගට ඇදී යන නීතිමය ක්‍රියා පටිපාටිය ප්‍රහාරයන්ට වගකිව යුතු වූවන්ට එරෙහිව කිසිදු ක්‍රියා මාර්ගයක් ගැනීම වලක්වාලීමට හා යට ගැසීමට රාජ්‍ය සංස්ථාපිතය හා එල්ටීටීඊය එකට එක්ව ඇති ආකාරය හෙලි කරයි.

කල් මරමින් සිටි කයිට්ස් පොලීසිය විසින් එල්ටීටීඊ සාමාජිකයන්ට හා ආධාරකරුවන්ට විරුද්ධව නඩු පවරනු ලැබුවේ, සසප හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* (*ලෝසවෙඅ*) තම සාමාජිකයන් ආරක්ෂා කිරීම සඳහා දියත් කල උද්ඝෝෂනයෙන් පසුව පමනි. එහෙත් අධිකරන ක්‍රියාවලිය දිග් ගැසුනු සය මසක කාලය තුල, ප්‍රදේශයේ පොලීසිය දින නියමයකින් තොරව ඒවා ප්‍රමාද කිරීමේ උපාමාරුවල යෙදී සිටියේ ය.

පලමු නඩුවේ දී, පොලීසිය එවකට කයිට්ස්හි එල්ටීටීඊ දේශපාලන නායකයා වූ සෙම්මනන්ට සිතාසි පවා බාර දී නො තිබුනි. පසු ගිය සැප්තැම්බර් මස සසප සාමාජිකයන්ට මරනීය තර්ජන එල්ල කිරීම පිලිබඳව ඔහුට චෝදනා ගොනු කර තිබුනි. එම තර්ජන එල්ල කෙරුනේ, ප්‍රදේශයේ එල්ටීටීඊ කාර්යාලය ඉදි කිරීමට අම්පිහයිනගර් ධීවර සමුපකාර සමිති සංගමයෙන් (ඒඑෆ්සීයූ) අරමුදල් ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ හේතුව මත ය. අතරතුර මාසවල දී, මුලුමනින් ම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රම යොදා ගනිමින් සංගමයේ පාලනය අල්ලා ගැනීමට එල්ටීටීඊය උත්සාහ දරා ඇත.

මෑත ම නඩු වාරය පැවති ජූනි 13 දා, සිතාසි භාර දී නොමැති බව පොලීසිය පස් වැනි වරටත් ප්‍රකාශ කලේ ය. පොලිස් නිලධාරීහු විවිධාකාරයේ දුබල තර්ක ඉදිරිපත් කරති. මුලින් දැක්වීමට උත්සාහ කෙරුනේ එය — ආන්ඩුව හා එල්ටීටීඊය අතර සටන් විරාමය නිරීක්ෂනය කරන — ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ (එස්එල්එම්එම්) වගකීමක් බව ය. එහෙත්, සිතාසි භාර දිය යුතු බවට අධිකරනය විසින් පොලීසියට නියෝග කරන ලද කල්හි ඔවුන් දැන් කියා සිටින්නේ සෙම්මනන් "සොයා ගත නො හැකි" බව යි. මෙය භූත කතාවකි. එල්ටීටීඊය ප්‍රසිද්ධියේ ම සෙම්මනන් යාපනයේ නියෝජ්‍ය දේශපාලන නායක තනතුරට උසස් කර තිබෙන අතර, ඔහු කොකුවිල්හි පිහිටි යාපනයේ ප්‍රසිද්ධ කාර්යාලයේ දී ලෙහෙසියෙන් ම සොයා ගත හැකි ය.

දෙවැනි නඩුව සසප සාමාජික නාගරාජා කෝඩීස්වරන්ට ඔක්තෝබර් 8 දා කායිකව පහර දීම සම්බන්ධයෙනි. දින ප්‍රමාදයකින් පසුව අවසානයේ දී පොලීසිය එල්ටීටීඊ සාමාජික කාතිකේසු අමිර්තලිංගම් රඳවා ගත්හ. හිසෙහි, ගෙලෙහි හා උරහිසෙහි තුවාල නිසා කෝඩීස්වරන් සිව් දිනක් රෝහල්ගතව සිටිය ද ආරම්භයේ සිට ම ප්‍රහාරයේ බර අවම කර පෙන්වීමට පොලීසිය උත්සාහ කලේ ය. ආරම්භයේ දී, සුලු තුවාල සිදු කිරීම ගැන පොලීසිය අමිර්තලිංගම්ට විරුද්ධව චෝදනා ගොනු කලේ ය. මෙය සාපේක්ෂව සුලු වරදකි. චෝදනා පිලිබඳව දිග් ගැසුනු නීතිමය විවාදය කඩිනම් කරමින්, ප්‍රහාරයේ හා පහරවල ස්වභාවය සලකා බැලීමේ දී පෙනී යන්නේ මෙය මිනීමැරීමට තැත් කිරීම පිලිබඳව බැලූබැල්මටම සාධක සහිත නඩුවක් බව ය යි කෝඩීස්වරන්ගේ නීතිඥවරයා පැහැදිලි කලේ ය. මෙය තව මත් විසඳිය යුතුව ඇත.

සසප සාමාජිකයන්ට තව දුරටත් තර්ජනය කිරීම හා ඔවුන් සතු ධීවර ආම්පන්නවලට අලාභහානි කිරීම පිලිබඳව තෙවන නඩුව පවරා ඇත. නඩුව සසපට එරෙහිව හැරවීමට පොලීසිය උත්සාහ කලේ ය. සසපයේ හඬ යටපත් කිරීම අරමුනු කර ගෙන, සසප සාමාජිකයන්ගේ පැත්තෙන් කිසිදු වැරදි දෙයක් කල බවට සාක්ෂි නො තිබිය දී ම සසපට හා එල්ටීටීඊයට වාරන නියෝගයක් පනවන ලෙස, පොලීසිය අධිකරනයෙන් ඉල්ලී ය. උසාවිය දෙපාර්ශ්වයෙන් ම ලිඛිත දිවුරුම් ප්‍රකාශ කැඳවී ය. සසප එය නිසි පරිදි ඉදිරිපත් කලේ ය. එල්ටීටීඊ නීතිඥවරයා දිවුරුම් ප්‍රකාශ කිසිවක් ඉදිරිපත් කිරීමට අසමත් වූවා පමනක් නො ව, පසු ගිය නඩුවාර දෙකට පෙනී සිටියේ ද නැත. මෙයින් නඩු විභාගය අනියතව ප්‍රමාද කෙරුනි. පොලීසිය හෝ උසාවිය මේ පිලිබඳව කිසිවක් කර නැත.

තව දුරටත් ඇන හිටුවීමේ උපක්‍රමවල යෙදීමට උසාවියෙන් පොලීසියට ඉඩ සැලසී ඇත. මෙය අදක්ෂකම හෝ පලපුරුද්ද නැතිකම පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. අවශ්‍ය වූ විට දී ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රචන්ඩත්වය හා ක්ෂනික ප්‍රතික්‍රියාවන් ක්‍රියාත්මක වන හැටි ගැන කවුරුත් දනිති. 19 වසරක් රටේ පැවති සිවිල් යුද්ධය තුල අනෙකුත් ආරක්ෂක හමුදාවන් ද සමග පොලීසිය ශ්‍රී ලංකාවේ කෲරතර ආරක්ෂක නීති රෙගුලාසි යටතේ නො වැදගත් ම සාක්ෂ්‍ය මත දහස් ගනනක් දෙමල වැසියන් "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස රඳවා තබා ගෙන ඇත. දැන් සමාජවාදීන්ට එරෙහි එල්ටීටීඊ මැරකම් පිලිබඳ සාක්ෂ්‍ය හමුවේ පවා ඔවුහු ඕනෑකමින් ම සුලුවෙන් හෝ ක්‍රියා කිරීමට මැලි වෙති.

මෙය ප්‍රාදේශීය පොලිස් නිලධාරීන් පුද්ගලිකව ඔවුන්ගේ කාර්යයන් පැහැර හැරීම පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. ඔවුන්ට ක්‍රියා කල හැක්කේ රාජ්‍යයේ ඉහල කොටස්වල අනුදැනීම මත පමනි. ඔවුන්ගේ කටයුතු කොලඹ එක්සත් ජාතික පෙරමුනු ආන්ඩුව (එජාපෙ) හා එල්ටීටීඊය අතර නව සම්බන්ධතාවන් සමග බැඳී ඇත. දෙපාර්ශ්වය ම දිග් ගැසුනු සිවිල් යුද්ධය නතර කරන දේශපාලන විසඳුමක් අපේක්ෂා කරති. පසු ගිය වසරේ පෙබරවාරියේ දී සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව කොලඹ පාලනය විවිධ රාජ්‍ය බලධාරීන් වෙත — මෙයට උතුරු-නැගෙනහිර පොලීසිය ද ඇතුලත් ය — එල්ටීටීඊයට වරද පැටවෙන කිසිවක් කිරීමෙන් වලකින ලෙසට උපදෙස් දී ඇත.

කයිට්ස්හි සහකාර පොලිස් අධිකාරි ජානක ගුනතිලක පසු ගිය ඔක්තෝබරයේ දී සසප නියෝජිතයෙකු ඇමතීමේ දී ආන්ඩුවේ නව පිලිවෙත ගැන කෙලින් ම සඳහන් කලේ ය. "අපට අපගේ පරීක්ෂනය පිලිබඳව එල්ටීටීඊය වෙත දැනුම් දිය හැකි ය. එහෙත් ඔවුන් නො පැමිනිය හොත් ආන්ඩුවේ නියෝගය නිසා අපට කිසිවක් කල නො හැකි ය. දැන් එල්ටීටීඊ කටයුතුවල වගකීම එස්එල්එම්එම්ට භාර වී ඇත" යි ඔහු කීවේ ය.

## දේශපාලන පලි ගැනීමක්

පසු ගිය නව මාසයේ වර්ධනයන් පිරික්සීමේ දී මතු වන මූලික ප්‍රශ්නයක් ඇත. සාපේක්ෂව කුඩා ධීවර සමිතියක පාලනය අල්ලා ගැනීමට හා සසපට එරෙහිව පලි ගැනීම සඳහා එල්ටීටීඊය මෙතරම් අසාමාන්‍ය දුරක් ගමන් කොට ඇත්තේ කුමක් නිසා ද?

මෙම කාරනය විවෘතව මතු කෙරුනු ලිපි ගනනාවක් *ලෝසවෙඅ* කයිට්ස්හි සමාජවාදීන් ආරක්ෂා කිරීමේ උද්ඝෝෂනය පරිහාසයට ලක් කල එල්ටීටීඊ ආධාරකරුවන් වෙතින් *ලෝසවෙඅ* අඩවියට ලැබී ඇත. සියලු දේශපාලන අවස්ථාවාදීන් සේ ම මොවුහු ද සංඛ්‍යාවන්ගෙන් හා ක්ෂනිකව දක්නට ඇති දෙයින් මෝහනය වූවෝ ය. දෙමල ජනතාවගේ අවිවාදිත නායකත්වය වන එල්ටීටීඊය, සසප වැනි කුඩා හා නො වැදගත් පක්ෂයක කටයුතු පිලිබඳව කරදර වන්නේ කුමටදැයි ඔවුහු අවඥා සහගතව ප්‍රශ්න කරති.

එහි ආධාරකරුවන් කෙසේ කීවත්, එල්ටීටීඊ නායකත්වය සසප හා එහි සමාජවාදී ක්‍රියා මාර්ගය තමන්ට නිශ්චිත දේශපාලන තර්ජනයක් සේ සලකති. සාම සාකච්ඡා ඉදිරියට යෑමේ දී වඩ වඩාත් පැහැදිලි වන්නේ, එල්ටීටීඊයේ ඉදිරි දර්ශනය මත ආන්ඩුව සමග බලය බෙදා ගැනීමේ සැලැස්ම, සිංහල මෙන් ම දෙමල වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන්ට එරෙහිව සෘජුව ම පිහිටා සිටින බව යි. එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු වන ඇන්ටන් බාලසිංහම් දැනට මත් "වෙලඳ පොල ආර්ථික පිලිවෙත්වලට" සහාය දෙන බවට ප්‍රතිඥා දී ඇත. මෙය තව දුරටත් ජනතාවන්ගේ ජීවන මට්ටම් කාබාසිනියා කරනු ඇත.

සිය දේශපාලන සහයෝගය බාදනය වීමේ හැකියාව ගැන උත්සුක වන එල්ටීටීඊය, සිය දේශපාලන විරුද්ධවාදීන්ගේ වැඩ කටයුතු මැඩීම සඳහා වඩාත් රුදුරු ක්‍රම හා විධි යොදා ගැනීමට නො පැකිලෙනු ඇත. දෙමල ධීවරයන් අතර වර්ධනය වන සසප ආයාමය පිලිබඳව එල්ටීටීඊය විශේෂයෙන් ම සංවේදීව සිටියි. වැඩ කරන ජනතාවගේ වඩාත් ම පීඩිත කොටස වන මෙම ධීවරයන් අතර මුල දී එල්ටීටීඊයට සැලකිය යුතු සහයෝගයක් තිබුනි.

සසප — හා එහි පූර්වගාමී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) — උතුරු-නැගෙනහිරින් ශ්‍රී ලංකා හමුදා වහා ම හා කොන්දේසි විරහිතව ඉවත් විය යුතු යැයි අඛන්ඩව කියා සිටි එක ම පක්ෂය යි. ඒ අතර ම සසප එල්ටීටීඊයේ වෙන ම දෙමල ඊලම් ධනේශ්වර රාජ්‍ය කැබැල්ලක් සඳහා වූ ඉල්ලීමට ද විරුද්ධ විය. ඒ, දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කල හැක්කේ අව්‍යාජ සමාජ සමානාත්මතාව සඳහා දෙමල හා සිංහල කම්කරු පන්තියේ ඒකාබද්ධ අරගලයකින් පමනක් බව අවධාරනය කරමිනි.

මෙම පදනම මත, සසප දෙමල ධීවරයන්ට නාවික හමුදාව විසින් පැනවුනු සීමාවන් හා තහංචිවලට එරෙහිව සම්මුති විරහිතව ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කල අතර, අම්පිහයිනගර් ධීවර සමුපකාර සමිති සංගමය හා 1999 දී පරුති අඩයිප්පු සංගමය ගොඩ නැගීමට මූලිකත්වය ගත්තේ ය. නාවික හමුදාව දුගී ධීවරයන්ගේ මාලු අස්වනු පැහැර ගත් විට මෙම සංගම් වන්දි ඉල්ලා උද්ඝෝෂනයේ යෙදුනහ. ආරක්ෂක හමුදාවන් විසින් ධීවරයන් හා ඔවුන්ගේ පවුල්වලට එරෙහිව සිදු කෙරුනු තිරශ්චීන ක්‍රියාවන් ද — ස්ත්‍රී දූෂනය හා ඝාතනයන් ද ඇතුලත් — සසප හෙලිදරව් කලේ ය.

සසපයේ ක්‍රියාකාරකම් මගින් සිය අයිතීන් ආරක්ෂා කිරීමේ පියවර ගැනීමට ප්‍රදේශයේ ධීවරයෝ දිරිමත් කෙරුනහ. නිදසුනක් ලෙස, 2000 මාර්තු මාසයේ දී, මසුන් මරන ස්ථාන හා වේලාවන් සීමා කරන ආන්ඩුවේ බාධාකාරී නියෝග කයිට්ස්හි ධීවරයන් මත පැනවීම සඳහා කැඳවුනු රැස්වීම ඔවුහු වර්ජනය කලහ. තම නියෝග ප්‍රසිද්ධියේම කඩ කිරීමෙන් කෝපාවිෂ්ට වූ රැස්වීමේ කැඳවුම්කාර ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (ඊපීඩීපී) ප්‍රාදේශීය නිලධාරී එන්. මතනරාජා, සිය දේශපාලන කටයුතු නතර කරන ලෙස සසප සාමාජික හා පරුති අඩයිප්පු සංගමයේ නායක ආර්. සුදර්ශන්ට තර්ජනාත්මක, "අවසන් හා තීරනාත්මක අනතුරු ඇඟවීමක්" නිකුත් කලේ ය.

2003 ජනවාරි මස, යාපනය සමුපකාර පරීක්ෂකවරයා හමු වූ අවස්ථාවේ දී, ඔහු එක හෙලා සුදර්ශන්ට කියා සිටියේ එල්ටීටීඊය පරුති අඩයිප්පු සමිතිය ලියාපදිංචි නො කරන ලෙසට දන්වා ඇති බව යි. සුදර්ශන් විරුද්ධ වුව ද පලක් නො වුනි. එල්ටීටීඊයේ කටයුතු හරියට ම ඊපීඩීපීයට සමාන්තරව යයි. එය ඔවුන් යුද්ධය පැවති කාලයේ දී ශ්‍රී ලංකා හමුදාවේ උපකාරක බලඇනියක් ලෙස කල කටයුතු පුලුල් වසයෙන් පිලිකුලට පාත්‍ර වූ සේ ය. 1999 දී, සසපයේ පුලුල් වන සහයෝගය ගැන උත්සුක වූ ඊපීඩීපීය, පරුති අඩයිප්පු සමිතිය පිලිගැනීම ප්‍රතික්ෂේප කරන ලෙස සමුපකාර පරීක්ෂකවරයාට බල කලේ ය.

මෙම වසරේ ජනවාරියේ දී උතුරේ දූපත්වල ධීවරයන් දහසක් පමන නියෝජනය කරන සමිති නායකයන් 18 දෙනෙක් රැස් වී සම්මේලනයක් ගොඩ

නැගීම පිලිබඳව එල්ටීටීඊය ඊටත් වඩා බිය වී සිටියි. තේරී පත් වූ නායකත්ව කමිටුව එහි සභාපති ලෙස සුදර්ශන් පත් කර ගත්හ. මෙය දැන ගත් පසු, සම්මේලනයේ නායකයන්ගේ රැස්වීමක් කැඳවූ එල්ටීටීඊය දේශපාලන ප්‍රශ්න ගැන විවාදයකින් තොරව නිලධාරිවාදී ක්‍රම මගින් සුදර්ශන් නෙරපා දැමූහ. එල්ටීටීඊ බලපෑම මත රැස්වීමට සහභාගි වූ සමුපකාර පරීක්ෂකවරයා සුදර්ශන්ගේ සමිතිය ලියාපදිංචි කර නොමැති බැවින් ඔහුට මෙහි සභාපති ලෙස කටයුතු කල නො හැකි බව ප්‍රකාශ කලේ ය.

කයිට්ස්හි එල්ටීටීඊ නායක අරුන්දවන් හා නාවුක අංශ ප්‍රධානියා වන මාරවන් මාස්ටර් ද රැස්වීමට සහභාගි වෙමින්, සසපට හා පැමින සිටි සමිති නායකයන්ට වක්‍ර ආකාරයෙන් තර්ජනය කලහ. එල්ටීටීඊයට අවනත නො වන හෙයින් සසප සාමාජිකයන්ට "නියම බෙහෙත්" දිය යුතු බවත් කරුවල කාමරවල දී ප්‍රශ්න කල යුතු බවත් අරුන්දවන් කියා සිටියේ ය. එල්ටීටීඊ පාලනය පවතින වන්නි ප්‍රදේශයේ දී මෙන් මෙහි දීත්, හිඟ මුදල් සමිති මගින් ධීවරයන්ට දෙන නයවලින් අය කර ගන්නා ආකාරය ප්‍රාදේශීය නායකයන් දන්නා බවට මාරවන් මාස්ටර් අනතුරු ඇඟවී ය.

### වැඩෙන විරුද්ධත්වය

සසපට එරෙහි එල්ටීටීඊ වැඩ කටයුතු, එය කෙරෙහි පලල් දෙමල ජනතාව තුල වැඩෙන විරුද්ධත්වයට කෙසේ ප්‍රතිචාර දක්වනු ඇද්ද යන්න ගැන තියුනු අනතුරු ඇඟවීමකි. දෙමල මෙන් ම සිංහල වැඩ කරන ජනතාවගේ අතිමහත් බහුතරයකට යුද්ධය අවසන් කිරීමට ඇති අවශ්‍යතාව ගැන සැකයක් නැත. එහෙත් එන්ට එන්ට ම පැහැදිලි වන්නේ ආන්ඩුව හා එල්ටීටීඊය එක්ව වාත්තු කෙරෙන සාම ගනුදෙනුවේ අරමුන, ජනතාවට නො ව මහා බලවතුන්ගේ ද විදේශ නියෝජිතයන්ගේ හා මහා ව්‍යාපාරිකයන්ගේ ද අවශ්‍යතාවන්ට සේවය කිරීම බව යි.

යුද්ධයෙන් අවතැන් වූ ලක්ෂ ගනනක් දෙමල වැසියෝ තව මත් අනාථ කඳවුරුවල හෝ වෙනත් තැන්වල කල් මරමින් සිටිති. යුද්ධයෙන් විනාශ වූ උතුරු-නැගෙනහිර ප්‍රදේශවල පුලුල් ලෙස පැතිර පවතින දුගී භාවය තුරන් කිරීමට කටයුතු කර ඇත්තේ මඳ වසයෙනි. එල්ටීටීඊයේ බදු පැනවීම් මගින් මූලික අවශ්‍යතාවන්ගේ මිල ඉහල යැමෙන් සමාජ ගැටලු තවත් උග්‍ර කරනු ලැබ තිබේ. සරනාගත කඳවුරු වැසියන් මෑතක දී *ලෝසවෙඅට* පැවසුවේ "ඔවුහු සියල්ලෝ ම මෙහි පැමින අපට කතා කර ආපසු යති. එහෙත් අපි තව මත් විඳවන්නෙමු" යන්න යි.

සිය මැයි දින පෙලපාලිවලට දසදහස් ගනනක් සහභාගි වනු ඇතැයි එල්ටීටීඊ සංවිධායකයන් බලපොරොත්තු පල කල ද එයට සම්බන්ධ වූයේ දෙදහසක් පමන වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ ජනතාව ඔවුන් වෙතින් ඉවත් වන තරම ය. අගමැති වික්‍රමසිංහ වෙත මෑතක දී යැවූ ලිපියකින් එල්ටීටීඊ න්‍යායාචාර්ය බාලසිංහම් ඉල්ලා සිටියේ, "අප කෙරේ ඇති ජනතා විශ්වාසය බිඳ වැටීමේ" හේතුව මත තමන්ට සහන සලසන ලෙස යි. පසු ගිය සතියේ, පිරිහෙමින් තිබෙන සිය දේශපාලන පදනම ශක්තිමත් කර ගැනීමේ මංමුලා සහගත වෑයමක යෙදෙමින් එල්ටීටීඊය විසින් "දෙමල පිබිදීමේ ව්‍යාපාරයක්" දියත් කරනු ලැබුනි.

සිය මූලික අයිතීන් ආරක්ෂා කර ගැනීමේ වෙනත් මාධ්‍ය කරා, වඩාත් ම සසප හා එහි සමාජවාදී විකල්පය කරා දෙමල කොටස් හැරෙනු ඇතැයි එල්ටීටීඊය බියපත්ව සිටියි. අනෙකුත් පක්ෂවලට මෙන් නො ව, දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමේ ද බලයට පත් ආන්ඩු මගින් ගෙන යන ලද යුද්ධයට එරෙහි වීමේ ද දිගු හා නො කැලැල් ඉතිහාසයක් ලංකාවේ සසපට පවතියි.

තෙවසරකට පෙර ඊපීඩීපීය යොදා ගැනුනු ක්‍රමවේදයන් ම දැන් එල්ටීටීඊය විසින් ද යොදා ගැනෙමින් තිබීම පුදුමයට කාරනයක් නො වේ. සාම ක්‍රියාවලිය තුලින් එය අපේක්ෂා කරන කාර්යය ඊපීඩීපීයෙන් එතරම් වෙනස් නො වේ. එනම්, ආන්ඩුව සමග එක්ව මහ ව්‍යාපාරිකයන්ගේ නිර්දේශ බල ගැන්වීම යි. මේ මත එයට සසප නුරුස්නේ වෙයි. කම්කරුවන් ද තරුනයන් සහ බුද්ධිමතුන් ද ආකර්ශනය කර ගන්නා ධ්‍රැවයක් වීමේ තර්ජනය සසප ඔවුන් වෙත ගෙන එයි. විවෘත දේශපාලන විවාදයක දී සිය ඉදිරි දර්ශනයට සහාය දිනා ගැනීමේ නො හැකියාව නිසා, ඊපීඩීපීය මෙන් ම එක එල්ලේ මැරකමට එල්ටීටීඊය ද යොමු වෙයි.

සසපට එල්ල වන එල්ටීටීඊ ප්‍රහාරයන්ට මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් අගයන සියල්ලෝ ම තරයේ විරුද්ධ විය යුතු වෙත්. එබැවින් *ලෝසවෙඅ* පාඨකයන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, එල්ටීටීඊය වෙත විරෝධතා ලිපි යවන ලෙසත් පක්ෂයේ ආරක්ෂක අරමුදලට නො මසුරුව ආධාර කරන ලෙසත් ය. සසපයේ අයිතීන් සුරැකීම සමස්තයක් ලෙස කම්කරු පන්තියේ ම අයිතීන් ආරක්ෂා කිරීමේ අත්‍යාන්ත කොටසකි.

පහත සඳහන් තැන්වලට ලිපි යැවිය හැකි ය.

1. ඉලම්පරිති,
   එල්ටීටීඊ කාර්යාලය,
   පොට්පානි පාර,
   කොකුවිල්,
   යාපනය.
2. එල්ටීටීඊ,
   ශ්‍රී. ලං. සටන් විරාම නිරීක්ෂන කමිටුව බාරේ,
   තැ.පෙ. 1930,
   ගාලු පාර, කොලඹ-03.
   ඊමේල් - slmm-hq@mfa.no
3. The LTTE
   c/- Eelam House,
   202, Long Lane,
   London SE1-4QB,
   United Kingdom.
   Tele - 44-207-403-4554
   Fax - 44-207-403-1653

කරුනාකර පිටපත් wsws වෙත එවන්න - Editor@wsws.org

© www.wsws.org